# NATURE OF POLITICAL SCIENCE, STUDY OF POLITICS AND APPROACHES (Part I)

# දේශපාලන විද්‍යාව හඳුනා ගැනීම.

දේශපාලන විද්‍යාව යනු අප හැමගේ සමාජ ජීවිතයේ ප්‍රධාන පැතිකඩක් වන දේශපාලනය යන්න ශාස්ත්‍රීය ලෙස හැදෑරීමේ විෂය ක්ෂේත්‍රය ලෙස අපට කෙටියෙන් හා සරල ව තේරුම් කළ හැකි ය.

දේශපාලනය යනු පුළුල් අර්ථ දක්වන සංකල්පයක් බව ද දේශපාලනය පිළිබඳ ව ශාස්ත්‍රීය ලෙස හදාරන විට අපට පෙනෙනු ඇත.

දේශපාලනය ශාස්ත්‍රීය ලෙස හැදෑරීම පිළිබඳ ව දීර්ඝ ඉතිහාසයක් තිබේ. ක්‍රි.පූ. සිවු වන සියවස තරම් ඈත කාලයේ ග්‍රීසියේ ඇතැන්ස් නුවර දේශපාලනය හැදෑරීම, ප්‍රගුණ කිරීම, සහ පුහුණු කිරීම විශේෂ ශාස්ත්‍රාලයයක සිදු විය.

ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් යන සුප්‍රසිද්ධ දාර්ශනිකයෝ දේශපාලනය පිළිබඳ මෙම ග්‍රීක සම්ප්‍රදායේ ආරම්භකයෝ ය. වර්තමානයේ පාසල්වල සහ විශ්ව විද්‍යාලවල "දේශපාලන විද්‍යාව" යන විෂයය ඉගැන්වීම මෙම සම්භාව්‍ය සම්ප්‍රදායයි තව දුරටත් ඉදිරියට ගෙන යාමකි.

ClassWork.LK

''දේශපාලන විද්‍යාව හැදෑරීම'' යන අදහසෙහි ද අර්ථ කිහිපයක් තිබේ. දේශපාලනය සහ ඊට සම්බන්ධ පැතිකඩ ගැන ඉගෙන ගැනීම, පර්යේෂණ කිරීම, විග්‍රහ කිරීම, පවතින න්‍යාය සහ සංකල්ප විචාරයට ලක් කිරීම, අලුත් න්‍යාය සහ සංකල්ප ගොඩනැඟීම, පවත්නා දේශපාලන ප්‍රතිපත්ති හා ක්‍රම විචාරයට ලක් කරමින් නව විකල්ප යෝජනා කිරීම, දේශපාලනයේ යෙදෙන්නන්ට මෙන් ම පුරවැසියන්ට ද දේශපාලන අවබෝධය ලබාදීම යන මේවා එයට ඇතුළත් වේ.

ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් ද තම ශාස්ත්‍රාලයයේ දේශපාලන විද්‍යාව ඉගැන්වීමෙන් සහ පුහුණු කිරීමෙන් ඉටු කළේ මෙම කාර්ය ය. පුරාතන ඉන්දියාවේ සහ චීනයේ ද රාජ්‍ය පාලනය පිළිබඳ විශේෂඥයෝ මෙවැනි ම කාර්යයක් ඉටු කළහ. වර්තමානයේත් පාසල්වල ද විශ්ව විද්‍යාලවල ද දේශපාලන විද්‍යාව හැදෑරීමේ න්‍යාය පත්‍රයේ මෙම අරමුණු තිබේ.

ClassWork.LK

# දේශපාලන විද්‍යාව යනු කුමක්දැයි හඳුනා ගැනීමේදී වැදගත් මූලික කාරණා

දේශපාලන  විද්‍යාව යනු පැරණිතම ශාස්ත්‍රීය ශික්ෂණයකි දර්ශනවාදය, ගණිතය, තර්ක ශාස්ත්‍රය, ආචාර විද්‍යාව, සෞන්දර්ය විද්‍යාව යන ශික්ෂණයන්ට සමගාමී ව දේශපාලන විද්‍යාව ද විකාශනය වීම ආරම්භ වූයේ ක්‍රිස්තු පූර්ව හතර වැනි සියවසේ තරම් අතීතයේ සම්භාව්‍ය ග්‍රීසියේ ය.

ශාස්ත්‍රීය ශික්ෂණයක් වශයෙන් දේශපාලන විද්‍යාවේ ස්වභාවය, විෂය පථය හා අන්තර්ගතය, විධික්‍රම, න්‍යාය සහ සංකල්ප යන මේවා විවිධ ප්‍රභවයන් වෙතින් සියවස් විසිපහකට ආසන්න දීර්ඝ කාලයක් තුළ ගොඩ නැගුණු, වෙනස් වූ සහ වර්ධනය වූ ඒවා ය.

දේශපාලන විද්‍යාවේ ප්‍රවේශ, න්‍යාය සහ විධික්‍රම බහුවිධ වේ. ඒවා විවිධ ගුරුකුලවලට හා සම්ප්‍රදායවලට අයත් ව ඇත. දේශපාලන විද්‍යාව හැදෑරීමේ එක් ආකර්ෂණයක් වන්නේ මෙම විවිධත්වය යි.

ClassWork.LK

දේශපාලන විද්‍යාව යනු දේශපාලනය ශාස්ත්‍රීය ලෙස හදාරණ ශික්ෂණය බව අපි ඉහත සඳහන් කළෙමු. මේ ප්‍රකාශනයේ වැදගත් තේමා දෙකක් ඇතුළත් ය.

I. දේශපාලනය,
II. දේශපාලන විද්‍යාව

## දේශපාලනය යනු කුමක් දැයි හඳුනා ගැනීම.

දේශපාලනය යනු කුමක් ද යන්නට පොදුවේ ලැබෙන සරල පිළිතුර නම් ''දේශය පාලනය කිරීම'' යන්නයි. මෙය දේශපාලනය යන සංකල්පය පිළිබඳව ඇති ජනප්‍රිය, නැතහොත් එදිනෙදා ව්‍යවහාරයේ ඇති, වටහා ගැනීම යි. ඒ සමගම එය දේශපාලනය ගැන ඇති සම්පූර්ණ අර්ථකථනයක්ද නොවේ. එය වනාහි දේශපාලනය යන සංකල්පයේ වාච්‍යාර්ථය පමණක් සලකා ගොඩනගා ගත්තකි.

ශාස්ත්‍රීය වශයෙන් මෙම පදයේ ගැඹුරු අර්ථයද හඳුනාගත යුතු ය.

ClassWork.LK

දේශපාලන විද්‍යාව මෙන්ම දේශපාලනයද ප්‍රධාන අර්ථ දෙකකින් යුක්ත ය.

- ❖ රාජ්‍යය, රාජ්‍ය පරිපාලනය සහ ආණ්ඩුකරණය පිළිබඳ ඇඟවෙන සංකල්පයක් ලෙස,

- ❖ රාජ්‍යයට පමණක් සීමා නොවී රාජ්‍යයෙන් බාහිරවද පුරවැසියන් සහභාගි වන සමාජ භාවිතයක් ලෙස,

ClassWork.LK

## දේශපාලනය යන්න රාජ්‍යය, රාජ්‍ය පරිපාලනය හා ආණ්ඩුකරණය සම්බන්ධ කොට තේරුම් ගැනීම.

මෙය වනාහි දේශපාලනය පිළිබඳව තිබෙන සම්භාව්‍ය අර්ථකථනයයි.

පුරාතන ග්‍රීසියේ මෙන් ම ඉන්දියාවේ සහ චීනයේ දාර්ශනිකයන් ද දේශපාලනය යන්න තේරුම් කෙළේ රාජ්‍යය හා රාජ්‍ය බලය පාවිච්චි කිරීම සමඟ සම්බන්ධ කොට ගෙන ය.

ඉංග්‍රීසි භාෂාවේ පොලිටික්ස් (politics) යන්න ග්‍රීක භාෂාවේ පෝලිටිකෝස් (politikos) යන වචනයෙන් බිදී ආවෙකි. ''පොලිස්'' (Polis) යනු පෞර රාජ්‍යයයි. එනම් කුඩා නගර කේන්ද්‍ර කොටගත් රාජ්‍යයයි. ''පෞර රාජ්‍යයට අයත්'' යන්න Politikos යන ග්‍රීක වචනයේ අර්ථයයි.

Class Work.LK

ඒ මඟින් දේශපාලන විද්‍යාව යන්නෙන් අදහස් වූයේ පෞර රාජ්‍යයට සම්බන්ධ විෂය කාරණා අධ්‍යයනය කරන විද්‍යාව/ශාස්ත්‍රය යන්නයි. පෞර රාජ්‍යයට සම්බන්ධ විෂය කාරණාවලට පුළුල් පරාසයක පැතිර ගිය තේමා ගණනාවක් අයත් විය.

- රාජ්‍යයේ ස්වභාවය
- රාජ්‍යයේ අරමුණු.
- රාජ්‍ය පාලන ක්‍රම
- රාජ්‍ය හා පුරවැසියා අතර සම්බන්ධය
- පාලකයන්ගේ ගතිගුණ හා කුසලතා
- ආණ්ඩුකරණ ක්‍රියාවලිය

ඉන් ප්‍රධාන තේමා කිහිපයකි.

පුරාතන ඉන්දියාවේ මෙන්ම චීනයේද "දේශපාලනය" යනුවෙන් මෙම අර්ථයම අදහස් කළ බව කෞටිල්‍ය සහ කොන්ෆියුසියස් යන චින්තකයන්ගේ කෘතිවලින් පෙනේ.

ClassWork.LK

මෙම චින්තකයන් දෙදෙනා සහ ඇරිස්ටෝටල්ද පැවසූයේ පාලකයන්ට රාජ්‍යය පාලනය පිළිබඳව උපදෙස් දීම, දේශපාලන විශේෂඥයන්ගේ කාර්යයක් වියයුතු බවයි.

වර්තමානයේද මෙම සම්ප්‍රදාය අඩු වැඩි වශයෙන් පවතී.

**දේශපාලනය සමාජ භාවිතයක් ලෙස**

දේශපාලනය යනු රාජ්‍යය, ආණ්ඩුව සහ රාජ්‍ය පරිපාලනය යන ක්ෂේත්‍රවලට සීමා නොකොට, ඒවායින් පිටත සමාජයේ පුරවැසියන් අතර පවත්නා භාවිතයකි යන්න මෙයින් අදහස් වේ.

උදාහරණ :-

පුරවැසියෝ පාලකයන් පත් කරති; ඔවුන්ට ආණ්ඩු කිරීම සඳහා බලය පවරා දෙති; දේශපාලන පක්ෂවල සාමාජිකයෝ වෙති. මීට අමතරව රැස්වීම් පෙළපාළි, විරෝධතා, වැඩවර්ජන, කැරලි ගැසීම්, ස්වේච්ඡා සමිති මඟින් පොදු වුවමනා ඉටු කිරීම යනාදි මාධ්‍යයන්ගෙන් දේශපාලන ක්‍රියාකාරීත්වයේ යෙදෙති.

ClassWork.LK

මේ අනුව පාලකයන් සහ වෘත්තීය දේශපාලනඥයන් පමණක් නොව පුරවැසියෝද දේශපාලනය කරති. මෙය ග්‍රීක යුගය තෙක් ද දිවෙයි. "දේශපාලනය" යනු පෞර රාජ්‍යයට සම්බන්ධ කාරණායක්ය යන ග්‍රීක අදහසේ අර්ථ දෙකක් තිබිණ. ඒවා නම්;

- රාජ්‍යය හා රාජ්‍ය පාලනයට සම්බන්ධ කාරණා
- රාජ්‍ය කටයුතු සම්බන්ධව පුරවැසියන්ගේ කාර්යභාරය හා ක්‍රියාකාරිත්වය.

උදාහරණ :-

ග්‍රීසියේ එකල පැවති සෘජු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයේ සෘජු පුරවැසි සහභාගිත්වයක් තිබිණි. නීති සම්පාදනයට, නගර පරිපාලනයට සහ අධිකරණය සම්බන්ධ කටයුතුවලට පුරවැසියෝ ස්වේච්ඡාවෙන් සහභාගි වූහ. "සක්‍රිය පුරවැසියා" යන සංකල්පය ඇරිස්ටෝටල්ගේ *Politics* නම් කෘතියේ භාවිත වී ඇත්තේ මේ අර්ථයෙනි.

Class Work.LK

මේ අනුව පුරවැසි දේශපාලන සහභාගිත්වය යන්නට "දේශපාලනය" යන සංකල්පයෙහි විශේෂ තැනක් හිමි වී තිබේ. පුරවැසි ක්‍රියාකාරිත්වයක් සහ සහභාගිත්වයක් නැති දේශපාලනය ගැන සිතීමට පවා නොහැකි තරම් දැඩි ලෙස මෙම අර්ථය මුල් බැසගෙන ඇත.

ClassWork.LK

ClassWork.LK